# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්තමේන්තුව

## ඔක්තොම්බර් 02 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළගපොළ විද්‍යාලය

**<u>පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.</u>**

1. උදෑසන පරිසරයේ දැකිය හැකි වෙනස් කම් මොනවා ද?
2. දිනෙත්ගේ උදෑසන දින චර්යාව විස්තර කරන්න.
3. ගුරු දෙගුරුන්ගේ උපදෙස් පිළිපැදීම නිසා පුංචි ඔබට අත්වන ප්‍රයෝජන මොනවාද?
4. ආහාර ගැනීමේ වැරදි පුරුදු 03ක් කියන්න.
5. **හරි වැරදි පෙන්නා** යන කවිය කියන්න.
6. බෝසතාණෝ මව්පියන්ට උවටැන් කළ අවස්ථා දෙකක් කියන්න.
7. අප බුලත් දී වඳින අය කවුද?
8. තෙරුවන් කියන්න.
9. කිසිවෙකු නොමළ ගෙයකින් අබ සෙව්වේ කවුද?
10. **බුදු කරුණා යොමු වුණා** කවිය කියන්න.

**<u>දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,</u>**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ

1. තිස්ස තෙරුන්ගේ සිරුරේ බිබිලි ඇති විය. ( )
2. ත්‍රිවිද්‍යාව යනු ඥාණ හතරකි. ( )
3. බෝසතුන්ට කුසතණ පිළිගැන්වූයේ විශාකාවයි. ( )
4. අසරණ ළමයෙක්ට පොතක් දීම අනුග්‍රහ බුද්ධියෙන් දෙන දානයකි . ( )
5. යහපත් වචන කතා කළයුත්තේ පාසලේ දී පමණය. ( )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. කාන්තාරයේ ජලය ඇතැයි සැක කරන්නේ ...............................පඳුරු යට ය. (තණකොළ /ඊතණ)
2. මිතුරුකමේ අගය ගැන කියවෙන ජාතක කතාවක් වන්නේ...................(වන්නුපථ/කුරුමිග)
3. බුදුරදුන්ගේ දකුනත් අගසව් තනතුර................හිමිට ලැබුණි.(සැරියුත්/මුගලන්)
4. යේ ධම්මා හේතුප්පභවා ගාථාව දේශනා කළේ..................හිමි ය.(අස්සජි/සැරියුත්)
5. .................. කුමරු මහ ප්‍රජාපතී ගෝතමී දේවියගේ පුතාය.(නන්ද/රාහුල)

සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !